# පූනාමඩු ශාන්තිකර්මය සඳහා යොදා ගන්නා පූනාවෙහි සුවිශේෂීතාව

*එච්. පී. එස්. ආර්. රත්නවීර* [1]
HS/2013/0868

පූනාමඩු ශාන්ති කර්මය සඳහා යොදා ගනු ලබන පූනාවෙහි සුවිශේෂත්වය විමසා බලනු වස් මෙම පර්යේෂණ සටහනෙහි මුඛ්‍ය අරමුණයි. පූනාමඩු ශාන්ති කර්මය පහතරට හා සබරගමු සම්ප්‍රදායන්වල දෙවියන් උදෙසා සිදුකරනු ලබන ශාන්ති කර්මයක් වන අතර වස්දොස් දුරුකර ශාන්තියක් ලබා ගැනිම මෙකි යාතු කර්මයෙහි පරමාර්ථයයි. පූනාමඩු ශාන්ති කර්මයෙහි සුවිශේෂි ම අංගය පූනාවයි. එය සාදා ගන්නා ක්‍රමවේදය, එයට යොදා ගන්නා අමුද්‍රව්‍ය, පූනාව යොදා ගැනිමෙහි පුරාවෘත්තය, පූනාව වස්දොස් දුරුකිරීම සඳහා යොදා ගන්නා ආකාරය ආදිය පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමේදි අවධාරණය කළ හැකිය. මේ සඳහා උධෘත ලෙස පහතරට සම්ප්‍රදායේ එන පූනාමඩු යාගය යොදා ගනු ලබයි. දැනට ලියවී තිබෙන මූලාශ්‍ර හා සාහිත්‍යමය සාධක හා ක්ෂේත්‍ර ගවේෂණය මගින් ලබා ගන්නා දත්ත ද ඉහත කරුණු විශ්ලේෂණය කිරිම සඳහා උපයෝගී කර ගැනීමට අපේක්ෂිත ය. මින් ලබා ගන්නා තොරතුරු අනුව පර්යේෂණයේදී ගම්‍ය වූ සාධක දත්ත විශ්ලේෂණයේදී පූනාමඩු යාගය සඳහා යොදා ගන්නා පූනාවෙහි ඇති විශේෂත්වය පිළිබිඹු වේ. මෙය පහතරට හා සබරගමු සම්ප්‍රදායන්වල සිදුකරනු ලබන පූනාමඩුව සඳහා යොදා ගන්නා ප්‍රධාන උපකරණයක් මෙන්ම සැරසිල්ලක් වන පූනාවෙහි සුවිශේෂත්වය පිළිබඳ සවිස්තරාත්මක සටහනයි.

ප්‍රමුඛ පදඃ පූනාව, පූනාමඩුව, වස්දොස්

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) ප්‍රථම වසර* sadunirathnaweera1993@gmail.com